ශීර්ෂය 264 - යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය -2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 264 - යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන්

ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) මූලධන වියදම්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	නල්ලූර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අයිතම් 115 කට අයත් වටිනාකම රු.239,906 ක් වූ භාණ්ඩ වර්ග 19ක් මිලදී ගෙන තිබූ අතර ඒවා මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම් ගත කළ යුතු වුවද, අදාල භාණ්ඩ පුනරාවර්තන වැය ශීර්ෂය යටතේ ගිණුම් ගත කර තිබුණි.	මෙම භාණ්ඩවල ප්‍රයෝජනයට ගන්නා කාලය සහ වටිනාකම අඩු හේතුවෙන් පුනරාවර්තන වැය ශීර්ෂ යටතේ ගිණුම් ගත කරන ලදී.	අදාළ ගැලපීම සිදු කර මූල්‍ය ප්‍රකාශන නිවැරදි කළ යුතුය.

(ආ) දේපල, පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 කට අයත්, අපහරණය කළ මූල්‍ය නොවන වත්කම් 14 ක වටිනාකම රු.107,351 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙන් ඉවත්කර නොතිබීමෙන් වත්කම්වල වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	ප්‍රාදේශීය ලේකම් කාර්යල 02 ක වත්කම් දැනට නිවැරදි කර ඇත. ප්‍රාදේශීය ලේකම් කාර්යාල 01 ක වත්කම් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.	අදාළ ගැලපීම් සිදු කර ස්ථාවර වත්කම්වල නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශවල දැක්විය යුතුය.
(ii)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 කට අයත් ස්ථාවර වත්කම් 132 ක වටිනාකම තක්සේරු කර සමාලෝචිත වර්ෂයේ ගිණුම්වල දක්වා නොතිබීමෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ (ACA – P) මූල්‍ය නොවන වත්කම්වල සම්පූර්ණ වටිනාකම නිරූපණය නොවීය.	තක්සේරු දෙපාර්තමේන්තුවට දැනුම් දී ඇතත්, මෙතෙක් තක්සේරු කිරීමට කටයුතු කර නොමැත. තක්සේරු වටිනාකම ලැබීමෙන් පසු ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ.	තක්සේරු කටයුතු කඩිනම් කර ස්ථාවර වත්කම්වල නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශවල දැක්විය යුතුය.

(ඇ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව විදුලි උපකරණ ලේඛනය යාවත්කාලීන කළ යුතු වුවත් වර්ෂය 10 කට වැඩි කාලයක සිට එසේ කර නොතිබුණි.	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ලේඛන යාවත් කාලීන කර ඇත. යාවත්කාලීන නොකළ ලද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් වෙත එසේ යාවත්කාලීන කරන ලෙස දැනුවත් කර ඇත.	ලේඛන යාවත්කාලීන නොකළ නිලධාරීන්ට පියවර ගැනීමත්, මුදල් රෙගුලාසි 454(2) සඳහන් පරිදි රජයේ ගොඩනැගිලි විදුලි උපකරණ ලේඛන අදාළ පරිදි යාවත්කාලීන කිරීමත් කළ යුතුය.

(ii)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදෙශ සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශය අනුව මිල ගණන් කැඳවීම් ලේඛනය යාවත්කාලීන කළ යුතු වූවත් වර්ෂය 10 කට වැඩි කාලයක සිට එසේ කර නොතිබුණි.	- එම -	ලේඛන යාවත්කාලීන නොකළ නිලධාරීන්ට පියවර ගැනීමත් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශය 5.2.1 අනුව යාවත්කාලීන කිරීමත් කළ යුතුය.
(iii)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදෙශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය අනුව ප්‍රසම්පාදන කමිටුවේ සහ තාක්ෂණ ඇගයීම් කමිටුවේ ලේකම් විසින් පැමිණීමේ ලේඛනය පවත්වා ගෙන යා යුතු වූවත්, ඉකුත් වර්ෂ 10 ක වැඩි කාලයක සිට එසේ පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි.	- එම -	ලේඛන පවත්වා නොගත් නිලධාරීන්ට පියවර ගැනීමටත්, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශය 2.11.2 අනුව කමිටුවේ ලේකම් විසින් පැමිණීමේ ලේඛන පවත්වා ගෙන යාමටත් කටයුතු කළ යුතුය.

(ඇ) විගණන සාක්ෂි නොවීම

	විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(i)	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක පිහිටා ඇති ඉඩම් පවරා ගැනීමට කටයුතු කර නොතිබූ අතර, ඉඩම්වල වටිනාකම රු.137,878,752 ක් ලෙස ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගතකර තිබුණද, එය සනාථ කර ගැනීමට අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි. එම ඉඩම්වල රු. 254,917,386 ක් වටිනා ගොඩනැගිලි ද ඉදි කර තිබුණු බව නිරීක්ෂණ විය.	ඉඩම් සම්බන්ධයෙන් මිනින්දෝරු දෙපාර්තමේන්තුව සහ අදාළ අමාත්‍යාංශය වෙත ලිපි යවා ඇති අතර, පිළිතුරු ලැබීමෙන් පසු අවශ්‍ය කටයුතු කරනු ලැබේ.	විධිමත් පිරිදි කටයුතු කර ඉඩම් අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය
(ii)	කරෙයිනගර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තිබෙන මාලු වාඩිවල වාර්ෂික අයවීම් විස්තර විගණනයට ඉදිරිපත් නොකිරීමෙන් එම ආදායම පිළිබඳ පිළිගැනීමට හෝ සනාථ කිරීමට නොහැකි විය	මාලු වාඩිවල ආදායම් අයකිරීම් විස්තර අඩංගු ලේඛනයක් පවත්වා ගෙන යන අතර, එය විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.	විස්තර ඉදිරිපත් නොකළ නිලධාරීන්ට පියවර ගැනීමටත්, විගණනයට අවශ්‍ය සාක්ෂි අදාළ පරිදි ඉදිරිපත් කර සනාථ කළ යුතුය.
(iii)	වලිකාමම් උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරි වසමක ඉඩම් හිමියන් 157 දෙනෙකුට තම ඉඩම්වල ළඳුකැළෑ සහ පඳුරු ඉවත් කිරීම සඳහා රු. 4,931,213 ක් ගෙවීම් කර තිබුණද, අදාළ වැඩ කොටස් නිම කළ බව තහවුරු කර ගැනීමට වැඩ වාර්තා හා ප්‍රමාණපත්‍ර ඉදිරිපත් කර නොතිබුණි.	අදාළ මුදල වර්ෂ අවසානයේදී ගෙවීම් කර තිබුණද, ඉඩම්වල අයිතිය තහවුරු කිරීමේ ගැටළු හේතුවෙන් ක්‍රමක්ක්‍රමයෙන් අයිතිය තහවුරු කර ගැනීමෙන් පසු ප්‍රතිලාභීන්ට	තහවුරුමය සාක්ෂි නොමැතිව ගෙවීම් කිරීම හා මුදල් රෙගුලාසි අංක 137, 138, 139 සහ 237(අ)(i) අනුව කටයුතු නොකිරීම සම්බන්ධයෙන් අදාළ පාර්ශව වෙත

	නිසිපරිදි මුදල් නිදහස් කර ඇත.	පියවර ගත යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු මෙම වාර්තාවේ 1.6.1 (ආ) (ii) ඡේදයේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ධීවර ආඥා පනතේ 33 වන වගන්තිය යටතේ අංක 337/47 දරණ ගැසට්පත්‍රයේ ප්‍රකාශ කරන ලද 1984 අංක 11 දරණ මාදකල් ධීවර රෙගුලාසි, 1947 අංක 08 දරණ රජයේ ඉඩම් ආඥා පනත සහ උතුරු පළාත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ සහකාර ලේකම්ගේ අංක G/NPC/AQ/Land/Lease සහ 2022 ජනවාරි 26 දිනැති ලිපිය ප්‍රකාරව වෙරළබඩ ප්‍රදේශයේ මාලු දැල් ඇදීම සඳහා වාර්ෂික බදු මුදල් අයකළ යුතු බව සඳහන් කර තිබුණද, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 05 ක 2024 වර්ෂයේදී පුද්ගලයන් 99 දෙනෙකුගෙන් අයවිය යුතු බදු මුදල වන රු.6,498,300 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	කිහිප දෙනෙකුගෙන් බදු කුලි අයකර ගෙන ඇති අතර, අනෙකුත් අයගේ දැල් ඇදීමේ බලපත්‍ර අවලංගු කර ඇත.	හිඟ ආදායම් කාලීනව අය නොකළ නිලධාරීන්ට පියවර ගැනීමටත්, ගිවිසුම් අනුව හිඟ මුදල් අයකර ගැනීමට කඩිනම් පියවර ගැනීමත් කළ යුතුය.
(ආ)	1996 අගෝස්තු 01 දිනැති අංක 96/05 දරණ ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛය අනුව වාර්ෂික බදුකුලී අයකර ගැනීම්, වාර්තා පවත්වා ගැනීම් හා අනෙකුත් ක්‍රියාවලිය අනුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක බදුකරුවන් 106 දෙනෙකුගෙන් බදුකුලි අයදුම්පත් ලැබී වර්ෂ 01 සිට 03 දක්වා කාලයක් ගතවී තිබුණද, ඒ සඳහා අවශ්‍ය කටයුතු කර නොතිබුණි.	වල්ලිපුරම් ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයට දීර්ඝ කාලීන බදුකුලි වශයෙන් ඉඩම් ලබා දී, එයට අදාළ වාර්ෂික බදු කුලිය අයකර ගැනීමට අවශ්‍ය ලියවිලි ජාතික ජලසම්පාදන සහ ජලාප්‍රවාහන මණ්ඩලයට වෙත යවා ඇත.	බදු කුලී අයදුම්පත් සම්බන්ධයෙන් කාලීනව කටයුතු නොකළ නිලධාරීන්ට පියවර ගැනීමටත්, කඩිනම් වැඩපිළිවෙලක් යොදා ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛය අනුව කටයුතු කර වාර්ෂික බදු කුලී අයකර ගැනීමටත් පියවර ගත යුතුය.
(ඇ)	ඉඩම් අමාත්‍යාංශයේ අනුමැතිය යටතේ පදිංචිකරුවන් 07 දෙනකුට ඉඩම් ලබා	2016 සිට 2025 දක්වා බලපත්‍ර ලබාගත් බදුකරුවන් වෙත බදු	කාලීනව බදු මුදල් අය නොකළ නිලධාරීන්

දී තිබුණද, එම අයගෙන් අයකර ගතයුතු දීර්ඝකාලීන බදු මුදල් වර්ෂ 01 සිට 03 දක්වා අයකර නොතිබූ බව විගණනයේදී නිරීක්ෂණ විය.	මුදල් ගෙවන ලෙස ප්‍රාදේශීය ලේකම් විසින් දැනුම් දී ඇත.	සම්බන්ධයෙන් කටයුතු කිරීමටත්, චක්‍රලේඛය අනුව කඩිනමින් බදු මුදල් අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය.

3.2 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පුනරාවර්තන වැය විෂයන් 14 ක මූලික ප්‍රතිපාදනයෙන් ඉතිරිවීම් සියයට 11 සිට සියයට 74 ක් දක්වා පරාසයක පැවති එකතුව රු. 29,982,000 ක ප්‍රතිපාදන වෙනත් වැය විෂයන් වලට මාරුකර තිබුණි.	චක්‍රලේඛය අනුව වියදම් සීමා කිරීම්, නිලධාරීන් වැටුප් රහිත නිවාඩු ලබා ගැනීම් සහ ඉන්ධන හා විදුලි වියදම් අඩුවීම යන හේතුවෙන් ඉතිරිවීම් සිදුවිය.	ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව හා තාත්විකව සිදු කළ යුතු අතර, විධිමත් වැඩපිළිවෙලක් යොදා ප්‍රදේශයේ සංවර්ධන හා ජනතා සුභ සිද්ධිය සඳහා ප්‍රතිපාදන පූර්ණ උපයෝජනයක් සිදු කළ යුතුය. එසේ කටයුතු කර නොමැති නිලධාරීන්ට පියවර ගත යුතුය.
(ආ)	ප්‍රාග්ධන වැය විෂයන් 07 ක් සඳහා වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 12 සිට සියයට 60 දක්වා වූ පරාසයක පැවැති එකතුව රු.88,691,620 ක ප්‍රතිපාදන වෙනත් වැය විෂයන්වලට මාරු කර ගෙන තිබුණි.	- එම -	- එම -

3.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු 15 කින් පුනරාවර්තන වැය විෂයන් සඳහා සමාලෝචිත වර්ෂයේදී ලබා දී තිබූ මූල්‍ය ප්‍රතිපාදන රු.43,821,756 කින් රු.40,436,542 ක් පමණක් වැය කර තිබූ අතර මෙම ඉතිරිය රු.3,385,334 ක් ප්‍රතිපාදන ආපසු යවා තිබුණි. එය සියයට 06 සිට සියයට 100 දක්වාවූ පරාසයේ පැවැතුණි.	වෙනත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවලින් පුනරාවර්තන වැය සඳහා ලැබුණු ප්‍රතිපාදනයේ ඉතිරිය අදාළ කාල පරිච්ඡේදයේදී ආපසු ගන්නා ලෙස දන්වා තිබුණද, ඒ අනුව ක්‍රියා නොකිරීමෙන් මෙම ඉතිරියක් ලෙස දැක්වීමට සිදුවිය.	ලැබෙන ප්‍රතිපාදන ප්‍රදේශයේ සංවර්ධනය ඉහළ නංවා ගැනීම සඳහා විධිමත්ව යෙදවීමට වැඩපිළිවෙලක් සැකසිය යුතු අතර එසේ නොකළ නිලධාරීන්ට පියවර ගත යුතුය.
(ආ)	අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු 03 කින් ප්‍රාග්ධන වැය විෂයන් සඳහා සමාලෝචිත	ජනාධිපති ලේකම් කාර්යාලය මගින් සංවර්ධන ව්‍යාපෘති	- එම -

	වර්ෂයේ ලබා දී තිබූ මූල්‍ය ප්‍රතිපාදනය වටිනාකම රු.920,746,668 කින් වටිනාකම රු.645,657,261 ක් පමණක් වැය කර තිබුණු අතර ඉතිරිය වූ රු.275,089,407 ක ප්‍රතිපාදන ආපසු යවා ඇත. එය සියයට 09 සිට සියයට 30 දක්වා වූ පරාසයේ පැවැතුණි.	සඳහා ලබා දී තිබූ මුදල් ප්‍රතිපාදනය PS/PIMD/07/01/II අංක දරන හා 2024.10.28 දිනැති චක්‍රලේඛය අනුව අදාළ සංවර්ධන ව්‍යාපෘති නැවත්වීම හේතුවෙන් ඉතිරියක් විය.	
(ඇ)	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 06 කාන්තා කටයුතු අමාත්‍යාංශයේ අංක **WA/WB/EEW** හා 2015 සැප්තැම්බර් 03 දින දරන ලිපිය අනුව, වැන්දඹු හා කාන්තාවන් මූලික කරගත් පවුල්වල කාන්තාවන්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීම සඳහා ලබා දෙන ණය මුදල සඳහා මාස 03 ක සහන කාලයක් සහ ඉතිරි කොටස වාරික 12 කින් පොලී රහිතව අයකර ගත යුතු බව සඳහන් කර තිබුණද, ප්‍රතිලාභීන් 26 දෙදෙකුගෙන් 2024 දෙසැම්බර් 31 දිනට මාස 03 සිට මාස 11 දක්වා වූ කාල පරාසයක සිට අය නොවී පවතින එකතුව රු.263,000 ක හිඟ ණය මුදලක් පැවැතුණි.	ප්‍රතිලාභීන් කීප දෙනෙකුගෙන් හිග මුදල මුළුමනින්ම අයවී ඇත. අනෙකුත් ප්‍රතිලාභීන්ගේ හිග ණය අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කර ඇත.	ව්‍යාපෘතිය විධිමත්ව අධීක්ෂණය හා පසු විපරම් නොකළ හා කාලීනව ණය අය කිරීමට කටයුතු නොකළ නිලධාරීන්ට පියවර ගැනීමත්, හිඟ මුදල් අදාළ පරිදි අයකර ගැනීමට පියවර ගැනීමත් කළ යුතුය.
(ඈ)	ජනාධිපති ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රතිපාදන යටතේ 2018 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වාවූ කාල පරිච්ඡේදයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක ක්‍රියාත්මක කළ ග්‍රාම ශක්ති නවීන තාක්ෂණ - නව නිපයුම් ව්‍යවසායකත්ව වැඩසටහන් යටතේ ග්‍රාම නිලධාරි වසම් 12 ක ප්‍රතිලාභීන් 143 දෙනෙකුට ලබා දුන් ණය මුදලේ එකතුව රු.2,692,420 ක් වසර 05ක් පසුවී ඇතත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	- එම -	- එම -
(ඉ)	චක්‍රලේඛ උපදෙස් අනුව ණය ලබා ගන්නා සමාජිකයෙකු සමෘද්ධි බැංකු සමිතිවලින් ලබා ගත් ණය මුදල නිසි පරිදි ආපසු ගෙවා තිබීම අනිවාර්ය බව දක්වා තිබුණද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක සමෘද්ධි ප්‍රජා මූල්‍ය බැංකු 03 කින් ණය ලබා ගත් සාමාජිකයන් 68 දෙනෙකුට අදාළ එකතුව රු.16,960,000 ක ණය මුදලක් වසරකට වැඩි කාලයක් හිඟව තිබුණි.	චක්‍රලේඛ උපදෙස් අනුව ණය ලබා ගන්නා සමාජියෙකු සමෘද්ධි බැංකු සමිතිවලින් ලබා ගත් ණය මුදල නිසි පරිදි ආපසු ගෙවා තිබීම අනිවාර්ය බව දක්වා තිබුණද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක සමෘද්ධි ප්‍රජා මූල්‍ය බැංකු 03 කින් ණය ලබා ගත් එම ණය මුදල නිසි පරිදි ආපසු ගෙවා නොතිබුණු සාමාජිකයන් 68 දෙනෙකුගේ ණය මුදල අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කර ඇත.	ණය මුදල් කාලීනව අයකර ගැනීමට පියවර නොගත් නිලධාරීන්ට පියවර ගැනීමත්, හිඟ ණය කඩිනමින් අයකර ගැනීමට පියවර ගැනීමත් කළ යුතුය.

(ඊ)	සමෘද්ධි ප්‍රතිලාභීන්ගෙන් අනිවාර්ය ඉතිරි කිරීම් තැන්පත් මුදල, ප්‍රතිලාභියා වයෝවෘද්ධ වූ විට ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය යටතේ නිදහස් කළ හැකි බව සඳහන් වුවද, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 03කට අයත් සමෘද්ධි ප්‍රජා මූල්‍ය බැංකු 04 ක් වයස අවුරුදු 70 සිට වයස අවුරුදු 95 දක්වාවූ ප්‍රතිලාභීන් 724 දෙනෙකුගේ අනිවාර්ය ඉතිරි කිරීම් තැන්පත් මුදලේ එකතුව වූ රු.12,833,416 ක් නිදහස් කිරීමට කටයුතු කර නොතිබුණි.	වයස අවුරුදු 70 සිට වයස අවුරුදු 95 දක්වාවූ ප්‍රතිලාභීන් 724 දෙනෙකුගෙන් අනිවාර්ය ඉතිරි කිරීම් තැන්පත් මුදල ප්‍රතිලාභීන්ගේ ඉල්ලීම් අනුව නිදහස් කරනු ඇත.	ප්‍රතිලාභීන් දැනුවත් කර ඔවුන්ගේ ඉල්ලීම් ලිපි ලබාගෙන අදාළ මුදල් නිදහස් කළ යුතුයි.

3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	නිරීක්ෂණය වටිනාකම රු.	අනුකූල නොවීම	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක HAF/1/1/Duty/Vol –II සහ 2019 නොවැම්බර් 07 දිනැති ලිපිය	-	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක රාජකාරි කරන ක්ෂේත්‍ර නිලධාරීන් 37 දෙනෙකු මාසික ඉදිරි වැඩ සටහන්, බැහැර වීම් සහ දෛනික කළ වැඩසටහන් ඉදිරිපත් කර නොතිබුණි.	නිලධාරීන් ඉදිරි වැඩසටහන් ඉදිරිපත් නොකිරීම සම්බන්ධයෙන් අවවාද ලිපි යොමුකර ඇත. ඉදිරියේදි අදාල කාල පරිච්ඡේදයතුල ඉදිරි වැඩ සටහන්, බැහැරවීම් සහ දෛනික වැඩසටහන් ඉදිරිපත් කළ යුතු බව දැනුවත් කර ඇත.	චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු නොකළ නිලධාරීන්ට පියවර ගැනීමටත්, අනුකූලතාවය පවත්වා ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් සැකසීමත් කළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 13:2 සහ 22:1:1 වගන්ති	-	යම්කිසි විෂමාචාරයක් සම්බන්ධව මූලික විමර්ශන මාස 02 ක් ඇතුළත නිමකළ යුතු බවත් විධිමත් විනය පරීක්ෂණය මාස 06 ක් ඇතුළත නිමකළ යුතු වුවත්, යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යන කාර්යාලවල රාජකාරි කරන නිලධාරීන් 23	අදාළ නිලධාරීන්ගේ විනය පරීක්ෂණ සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට දැනුම් දී ඇත.	නීතිමය විධිවිධාන ප්‍රකාරව කඩිනමින් පරීක්ෂණ පවත්වා නිම කළ යුතුය.

			දෙනෙකුගේ විනය පරීක්ෂණ මාස 11 සිට මාස 132 දක්වා නිමකර නොතිබුණි.		
(ඈ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1(ආ) වගන්තිය	84,601,443	රු.500,000 ක වටිනාකමකට වැඩි වටිනාකම් ඇති භාණ්ඩ මිලදී ගැනීමේදී ගිවිසුම් ගත යුතු බව සඳහන් වුවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක භාණ්ඩ 67 ක් මිලදී ගැනීමේදී ගිවිසුම් ගතවී නොතිබුණි.	මෙම ක්‍රියාමාර්ගය අනුගමනය කළ යුතු බව නිලධාරීන් දැනුවත් කර ඇත.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශසංග්‍රහයේ 8.9.1(ආ) වගන්තිය අනුව කටයුතු කළ යුතුය.
(ඈ)	රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	-	සියළුම රජයේ නිලධාරීන් තම සේවා ස්ථානයට පැමිණීම සහ පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍ර මගින් සනාථ කළ යුතු බව සඳහන් වුවද, සමාලෝචිත වර්ෂයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක නිලධාරීන් 56 දෙනෙකු අවස්ථා 210 කදී ඇඟිලි සලකුණු සටහන් කර නොතිබුණි.	ඉදිරියේදි ඇඟිලි සළකුණු සටහන් නොකරන දිනයන් සඳහා නිලධාරීන්ගේ පුද්ගලික නිවාඩුවලින් අඩුකරන බව අභ්‍යන්තර ස්ථාවර නියෝග මගින් නිලධාරීන් දැනුවත් කර ඇත.	චක්‍රලේඛය අනුව කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගැනීමටත්, මෙම තත්ත්වය වළක්වා ගැනීමට අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීමටත් පියවර ගත යුතුය
(ඉ)	03/2020 අංක හා 2020 දෙසැම්බර් 31 දිනැති රාජ්‍ය පරිපරිපාලන චක්‍රලේඛය	-	වෙනත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 කට ස්ථාන මාරුවීම් ලැබ පැමිණී ඇති නිලධාරීන් 21 දෙනෙකු මාස 20 සිට මාස 69 ක් ඉකුත්වී ඇතත්, වැන්දඹු / වැන්දඹු පුරුෂ, අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් සම්බන්ධ විස්තර	දැනට විස්තර ලබා ගෙන ඇත. රාජ්‍ය පරිපාලන අංක 18/2020 ප්‍රකාරව නිලධාරියෙකු කලින් රාජකාරි කළ කාර්යාලයෙන් ලබා දෙන මෙන් ඉල්ලුම්කර ඇතත්, මෙතක් පිළිතුරු ලැබී නොතිබුණි.	චක්‍රලේඛය අනුව කටයුතු කර පෞද්ගලික ලිපි ගොනු යාවත්කාලීන කළ යුතුය.

			කලින් රාජකාරි කළ කාර්යාලවල සිට ලබා ගෙන පෞද්ගලික ගොනුවේ ගොනු කර නොතිබුණි.		
(ඊ)	ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4 වගන්තිය	776,600	සමාලෝචිත වර්ෂයේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ‘බී‘ ගිණුමේ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව 2024 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟව තිබූ, ධූරය හැර ගිය, විශ්‍රාම ගිය සහ මිය ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු හිඟ තිබූ කාලය මාස 03 සිට මාස 36 දක්වා ඇති ණය ශේෂයන් අනුව අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.	අදාල නිලධාරීන්ගේ හිඟ ණය ශේෂය විශ්‍රාම පාරිතෝෂික මුදලින් අයකරන මෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට දැනුම් දී ඇත. නිලධාරියෙකුගේ හිඟ මුදල ඇප කරුගෙන් කොටස් වශයෙන් අයකරනු ලැබේ. තවත් නිලධාරියෙකුගේ හිඟ මුදල අයකර ගැනීම සඳහා ලිපි යවා ඇති අතර, ඉදිරි කටයුතු කරමින් පවිති.	කාලීනව හිඟ ශේෂ අය කිරීමට පියවර නොගත් නිලධාරීන්ට පියවර ගැනීමත්, හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය.

3.5 තැන්පත් ශේෂ

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ආරක්ෂක තැන්පතු සහ තෙවන පාර්ශවයන්ට අපසු ගෙවිය යුතු තැන්පතුවල එකතුව රු.491,149 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 අනුව කටයුතු නොකර, වර්ෂ 4 කට වැඩි කාලයක් තැන්පත් ගිණුම්වල රඳවා ගෙන තිබුණි.	අදාල ව්‍යාපෘතිය සම්බන්ධ විස්තර 2024.07.02 දින කෘෂිකර්ම අමාත්‍යාංශ වෙත යවා ඇත. ව්‍යාපෘතිය නිමවූ පසු ආරක්ෂක තැන්පත් ආපසු ගෙවීමට කටයුතු කරනු ලැබේ.	මුදල් රෙගුලාසි 571 අනුව කටයුතු කර විධිමත්ව තැන්පතු නිරවුල් කළ යුතුය.
(ආ)	චුන්නාක්කම් මළ අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතිය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලද එකතුව රු.20,996,124 ක් අදාල කටයුතු සඳහා යෙදවීමට කටයුතු නොකර, වර්ෂ 03 සිට වර්ෂ 07 දක්වා තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.	චුන්නාකම් මළ අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතිය අවසන්වූ පසු තැන්පත් මුදල ආපසු ගෙවීමට කටයුතු කරනු ලැබේ	ව්‍යාපෘතිය විධිමත් පරිදි අවසන් කර තැන්පත් නියමිත පරිදි නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

3.6 වංචනික ස්වරූපයේ ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රතිලාභීන් වෙත ඉඩම් නිදහස් කිරීමේදී ඒවායේ පැවති ළඳු කැළෑ, නටබුන් සහ පඳුරු ඉවත් කිරීම - 2024 වැඩසටහන් යටතේ යන්ත්‍ර පැය අනුව පැය 1440 ක් වැඩ කර බවට, රු.10,478,000 ක් ගෙවීම් කර තිබුණි. එසේවුවද, අදාල වැඩ කළ පැය ගණන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තාක්ෂණ නිලධාරි, තාක්ෂණ සහායක සහ සංවර්ධන නිලධාරීන් විසින් සාවද්‍ය ලෙස සහතික ලබාදී තිබූ බව නියාදි පරීක්ෂණ වලදී තහවුරු වූ බැවින් ගෙවීම් කරන ලද පැය ගණන් පිළිබඳ විගණනයේදී සෑහීමට පත්වීමට නොහැකිව ඇත.	මෙම වැඩසටහන සඳහා අදාල ප්‍රදේශයේ ගම් මට්ටමේ නිලධාරි සමඟ කාර්යාලයේ නිලධාරීන්ද රාජකාරියේ යෙදුණු අතර, අදාල දිනවල වැඩ කළ බවට ඉඩමේ ප්‍රමාණය අනුව තීරණය කර එම අවස්ථාවේ ගම් මට්ටමේ නිලධාරී සමග සාකච්ඡා කර අදාල පැය ගණන් වැඩ කළ බව සනාථ කර ඇත.	ගෙවීම් සඳහා සාවද්‍ය ලෙස සහතික ඉදිරිපත් කළ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගත යුතුය.
(ආ)	ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලද ප්‍රතිපාදන යටතේ 2018 – 2019 කාල පරිච්ඡේදයේ තෙන්මරාච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ක්‍රියාත්මක කළ ග්‍රාම ශක්ති නව තාක්ෂණ - නව නිපැයුම් ග්‍රාම ශක්ති ව්‍යවසායකත්ව යන වැඩ සටහන සඳහා ග්‍රාම සේවා වසම් 12 කින් ග්‍රාම ශක්ති ප්‍රජා සමිති සඳහා ජීවනාධාර, නිපුණතා සංවර්ධන සහ යටිතල පහසුකම් යටතේ චක්‍රීය ණය වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.10,350,000 ක මුදලක් ලබාදී තිබූ අතර ඉන් ග්‍රාම නිලධාරී වසම් 08ක පිහිටවූ ග්‍රාම ශක්ති ප්‍රජා සමිති වෙත ලද රු.8,158,613 ක් ණය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ලබා දී ඇතත් එම මුදල යොදවාගත් අරමුණු සම්බන්ධ විස්තර, ලේඛන සහ ලියවිලි අදාළ සමිති සතුව නොතිබුණි. මේ සම්බන්ධයෙන් ප්‍රදේශීය ලේකම් කාර්යාලයේ විෂයභාර නිලධාරී විසින් හෝ ප්‍රජා බැංකුවල සභාපතිවරුන් විසින් අධීක්ෂණය කර නොතිබුණි.	ග්‍රාම ශක්ති සමිතිවල ලියවිලි, ලේඛන සහ විස්තර නොතිබුණු බැවින්, කොට්ඨාශ භාර නිලධාරීන්ගෙන් ලබා ගෙන ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයන් සිදුවී ඇත.	මාර්ගෝපදේශය අනුව අදාළ ගිණුම් තැබීම් සහ මුදල් යෙදවීමේ අරමුණු ලියවිලි මගින් සනාථ කිරීම් කළ යුතු අතර, විධිමත් පරීක්ෂණයක් සිදුකර අදාළ මුදල් සාවද්‍යාව පරිහරණය කිරීමක් සිදු වී ඇත්නම් අදාළ පාර්ශව වෙත විධිමත්ව කටයුතු කළ යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක 2023 වර්ෂයේ සුභසාධන ප්‍රතිලාභ ගෙවීම් සඳහා තෝරා ගන්නා ලද ප්‍රතිලාභීන් ගෙන් ප්‍රතිලාභීන් 319 දෙනෙකුට මාස 01 සිට 24 දක්වා වූ ප්‍රතිලාභ ගෙවීම් කර නොතිබුණි.	අස්වැසුම ප්‍රතිලාභීන් සඳහා සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ මෘදුකාංගයේ සිදුවූ දෝෂයක් නිසා ගෙවීම් කිරීමට නොහැකි විය. මේ සම්බන්ධයෙන් සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය දැනුවත් කර ඇති අතර, ඔවුන් විසින් ලබා දෙන තීරණය අනුව ඉදිරි කටයුතු කරනු ලැබේ.	අදාළ ආයතන සමඟ කඩිනමින් සම්බන්ධ වී සුභසාධන ප්‍රතිලාභ නියමිත කාලය තුළ ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංක 2023/01 හා 2023 දෙසැම්බර් 21 දින දරණ චක්‍රලේඛය අනුව ඉඩම් බලපත්‍ර හිමියන්ට, දීමනාපත්‍ර හිමියන්ට රජයේ ඉඩම්වල අයිතිය තහවුරු කිරීම සඳහා වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත සම්පූර්ණ අයිතිය පැවරීමේ බලපත්‍ර 28 ක් ලැබී තිබුණද, ඒවා ප්‍රතිලාභීන්ට නිකුත් නොකර මාස 06 ක් පමණ කාලයක් කාර්යාලයේ රඳවා ගෙන තිබුණි.	ඉඩම් සංවර්ධන කර පදිංචි විය යුතු බව ප්‍රතිලාභීන්ට දන්වන ලදි. ඔවුන් පදිංචි වී නොමැති බැවින් ලබා දීම ප්‍රමාද විය.	විධිමත් අධීක්ෂණයක් හා මගපෙන්වීමක් සිදු කර බලපත්‍ර ලබා දීමට කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධව පියවර ගැනීමටත්, ප්‍රතිලාභීන් දැනුවත් කර විධිමත් පරිදි බලපත්‍ර ලබා දීමටත් කටයුතු කළ යුතුය.
(ඇ)	ජනාධිපති ලේකම් කාර්යාලයේ අංක PS/PMU/ALLOC/01 සහ 2024 ජුලි 04 දිනැති ලිපිය ප්‍රකාරව දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන් 2024 යටතේ යාපනය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත යෞවන සමාජ 27 ක් සඳහා එක් සමාජයකට රු.500,000 ක් වටිනා ක්‍රීඩා භාණ්ඩ සහ උපකරණ ලබා දීම සඳහා රු.මිලියන 13.5 ක මුදලක් නිදහස් කර තිබුණද, යෞවන සමාජ 06 ක් සඳහා රු.3,000,000 ක් වටිනා ක්‍රීඩා භාණ්ඩ හා උපකරණ ලබා දී නොතිබුණි.	අදාළ යෞවන සමාජ විසින් 2024.08.01 වන දින ලිපි මගින් වෙනත් යෝජනා දිස්ත්‍රික් ලේකම් වෙත ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව, යෞවන සමාජ 21 ක් විසින් ක්‍රීඩා භාණ්ඩ හා උපකරණ අවශ්‍ය බව ඉල්ලුම් කර තිබුණ අතර, අනෙකුත් යෞවන සමාජ 06 ක් විසින් ක්‍රීඩා භාණ්ඩ නොවන වෙනත් භාණ්ඩ ඉල්ලා තිබුණද, එයට අදාල අනුමැතිය නොලැබීමෙන් එය ලබා දීමට නොහැකි විය.	විධිමත් පරිදි යෞවන සමාජ දැනුවත් කර අරමුණුගත ප්‍රතිලාභ නිසි පරිදි ලබා දීමට පියවර නොගත් නිලධාරීන්ට පියවර ගැනීමටත්, ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු සඳහා උපරිම කාර්යක්ෂමතාවයෙන් ප්‍රතිපාදන යොදවා ගැනීමේ වැඩපිළිවෙලක් සැකසීමත් කළ යුතුය.

4.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොතිබීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වඩමාරච්චි උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2021 වර්ෂයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘති යටතේ රු.4,872,142 ක් වටිනාකමින් ක්‍රියාත්මක කළ සිංකනගර් හකුරු නිෂ්පාදන මධ්‍යස්ථානය සඳහා ඉදිකළ ගොඩනැගිල්ල (Sinkanagar Jaggery Production Centre) අදාළ අරමුණ සඳහා යොදවා ගෙන නොතිබුණි. තවද, එම ගොඩනැගිල්ලේ ග්‍රාම නිලධාරි කාර්යාලයක් පිහිටුවා තිබීමෙන් අපේක්ෂිත අරමුණ ඉටුවී නොතිබුණු බව නිරීක්ෂණය විය.	ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ.	විධිමත් අධීක්ෂණයක් හා පසු විපරම් ක්‍රියාමර්ග ගෙන ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට කටයුතු නොකළ නිලධාරීන්ට විධිමත් පියවර ගැනීමටත්, අදාළ ව්‍යාපෘතිය ආරම්භ කර අපේක්ෂිත අරමුණ ඉටු කර ගැනීමට වැඩපිළිවෙලක් සැකසීමත් කළ යුතුය.
(ආ)	වඩමරාච්චි උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2022 වර්ෂයේ ගම සමග පිළිසඳර වැඩසටහන යටතේ එක් ග්‍රාම නිලධාරි වසමක කාන්තා සංවර්ධන සමිතියක් බැගින් තෝරාගෙන පපඩම් නිෂ්පාදනය සඳහා රු.320,355 ක් වටිනා උපකරණ ලබා දී තිබුණද, එම ව්‍යාපෘතිය අසාර්ථකවී තිබුණු බව ක්ෂේත්‍ර පරීක්ෂණයේදි නිරීක්ෂණ විය.	දැනට මෙම ව්‍යපෘතිය ක්‍රියත්මක කරමින් පවති.	- එම -
(ඇ)	2018 සහ 2020 යන වර්ෂවල අමාත්‍යාංශ දෙකකින් ලබා දී තිබූ, මූලා ප්‍රතිපාදනවලින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2021 වර්ෂයේදී රජයට පවරා නොගත් ඉඩමක රු.196,039,247 ක් වැය කර මට්ටුවිල් ආර්ථික මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිකර තිබුණද, මෙතෙක් එය ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.	මෙම ගොඩනැගිල්ල චක්‍රලේඛ අනුව වෙළෙඳ වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශයට භාර දී ඇති අතර, ඉදිරි කටයුතු කෙරෙමින් පවති.	අදාළ ආයතන සමඟ සම්බන්ධවී ප්‍රදේශයට ප්‍රතිලාභ ලබා දීමට මෙම ව්‍යාපෘති විවෘත කර අපේක්ෂිත අරමුණ ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඈ)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් නීර්වේලි කෙසෙල් චිප්ස් නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය ගොඩනැගිලි සහ යන්ත්‍රසූත්‍ර 2020 ජුනි මාසයේ ස්ථාපිත කර, නීර්වේලි කෙසෙල් නිෂ්පාදන හා අලෙවි කිරීමේ සමූපකාර සමිතියට භාරදී තිබුණද, එම වත්කම් වර්ෂ 04 කට වැඩි කාලයක් නිසි නඩත්තුවකින් තොරව නිෂ්කාර්යව තිබුණි. රු.10,325,421 ක් වැය කරන ලද මෙම ව්‍යපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යනයක් සිදු කර නොතිබුණි. මෙම යන්ත්‍ර යෝජිත නිෂ්පාදනට සුදුසු තත්ත්වයේ නොමැති බව සමූපකාර සමිතිය පවසා ඇති බැවින්, මේ සඳහා වැය කරන මුදල නිෂ්ඵල වියදමක් වී තිබුණි.	මෙම ගොඩනැගිල්ල 2024 දෙසැම්බර් මස එක් පුද්ගලයකුට බදු දී ඇති අතර, එහි සුළු වශයෙන් ආහාර වර්ග ඇසුරුම් කිරීමේ කර්මාන්තයක් ආරම්භ කර ඇත.	විධිමත් අධ්‍යනයකින් තොරව හා නිෂ්පාදනයට නොගැලපෙන යන්ත්‍ර සපයා දීම පිළිබඳ විධිමත් පරීක්ෂණයක් පවත්වා අදාළ පාර්ශව වෙත විධිමත් පියවර ගත යුතු අතර ව්‍යාපෘතිය සක්‍රීය කිරීමට වැඩපිළිවෙලක් සැකසිය යුතුය..

(ඉ)	ජනාධිපති ලේකම් කාර්යාලයේ මුලා ප්‍රතිපාදන යටතේ 2018 – 2019 කාල පරිච්ඡේදයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක ක්‍රියාත්මක කළ ග්‍රාම ශක්ති නවීන තාක්ෂණය - නව නිපයුම් ග්‍රාම ශක්ති ව්‍යවසායකත්ව වැඩසටහන් යටතේ චක්‍රීය ණය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ග්‍රාම ශක්ති ප්‍රජා සමිතියකට ලබා දී තිබූ, එකතුව රු.72,375,806 ක මුදල අදාළ අරමුණ සඳහා යොදවා නොගෙන මාස 03 සිට මාස 72 දක්වා බැංකු ගිණුමේ රඳවා ගෙන තිබුණි.	රටේ පැවැති අර්බුදකාරි තත්වය හමුවේ අයවීම් ප්‍රමාද විය. පසුව එම හිඟ මුදල අයකර ගත් අතර, චක්‍රීය ක්‍රමය අනුව ණය ලබා දීම ආරම්භ කර ඇත.	විධිමත් අධීක්ෂණයක් හා නියාමනයක් සිදු කර අදාළ ව්‍යාපෘති ආරම්භ කර අපේක්ෂිත අරමුණ ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඊ)	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 02 ක 2022 වර්ෂයේ ගම සමඟ පිළිසඳර වැඩසටහන යටතේ සහ 2024 විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ ග්‍රාම සේවා නිලධාරී වසම් 02 ක එකතුව රු.8,280,000 ක් වැය කර ව්‍යාපෘති ආරම්භ කර තිබුණද, අදාළ අරමුණ සඳහා යොදවා නොගැනීමෙන් එම ව්‍යාපෘතිය මගින් බලාපොරොත්තුවූ ප්‍රතිලාභ ලැබී නොතිබුණි.	මෙම ගොඩනැගිල්ලේ රැකියා විරහිත කාන්තාවන් සඳහා මැහුම් පන්ති පවත්වා එමගින් ළමා ඇඳුම් නිෂ්පාදන මධ්‍යස්ථානයක් පිහිටුවා ඇත. තවද, කාන්තා සුළු ව්‍යවසායකයන්ගේ නිෂ්පාදන අලෙවි කටයුතු ද මෙහි සිදුවේ.	අපේක්ෂිත අරමණු ඉටුකර ගැනීමට කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් පියවර ගැනීමටත්, අදාළ ව්‍යාපෘති ආරම්භ කර අපේක්ෂිත අරමුණ ඉටු කර ගැනීමටත් කටයුතු කළ යුතුය.
(උ)	2024 සංවර්ධන ව්‍යාපෘති යටතේ තෙන්මරාට්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත රු.30,195,000 ක් ප්‍රතිපාදන වෙන්කර තිබූ අතර, එයින් රු.30,191,206 ක් වැය කර රාමාවිල් යෞවන සමාජයට ක්‍රීඩා උපකරණ වර්ග 12 කට අයත් භාණ්ඩ 52 ක් ලබා දී තිබුණද, එය යෞවන සමාජය විසින් ප්‍රයෝජනයට නොගෙන ප්‍රදේශයේ පාසලක් වෙත ලබා දී තිබුණි.	දැනට එම සියළු ක්‍රීඩා භාණ්ඩ ආපසු ලබා ගෙන රාමාවිල් යෞවන සමාජය වෙත භාර දී ඇත.	ප්‍රතිලාභ ලබා දීමේ අවශ්‍යතා නොමැති යෞවන සමාජය හඳුනාගත් නිලධාරීන්ට පියවර ගැනීමටත්, විධිමත් අධීක්ෂණයක් හා පසු විපරමක් සිදු කර අදාළ ව්‍යාපෘති මගින් අපේක්ෂිත අරමුණ ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඌ)	කාන්තා කටයුතු අමාත්‍යංශයේ ලේකම්ගේ අංක WA/WB/EEW හා 2015 සැප්තැම්බර් 03 දින දරන ලිපිය අනුව, දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 03ක වැන්දඹු කාන්තාවන් මූලික කරගත් පවුල්වල කාන්තාවන්ගේ ජීවන මට්ටම ඉහල නැංවීම සඳහා ලබා දෙන ණය මුදල මාස 03 ක සහන කාලයක් සහ ඉතිරි කොටස වාරික 12 කින් ගෙවීමේ කොන්දේසි සහිතව ලබා දීම සඳහා ලැබී තිබූ රු.867,395 ක් ඉකුත් මාස 09 ක සිට මාස 17 ක් දක්වා කාලයක් අදාල අරමුණ සඳහා යොදවා නොගෙන, බැංකු ගිණුමක රඳවා ගෙන තිබුණි.	ඉදිරියේදී සුදුසු ප්‍රතිලාභීන් හඳුනාගෙන කඩිනමින් ණය ලබා දීමට කටයුතු කරන ලෙස නිලධාරීන් දැනුවත් කර ඇත.	ව්‍යාපති සක්‍රීයව පවත්වා ගැනීමට කටයුතු නොකරන වගකිවයුතු නිලධාරීන්ට විධිමත් පියවර ගැනීමටත්, අදාළ ව්‍යාපෘති ආරම්භ කර අපේක්ෂිත අරමුණ ඉටු කර ගැනීමටත් කටයුතු කළ යුතුය.

4.3 අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මී මැසි පාලන ව්‍යාපෘතිය යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් එළඹී ගිවිසුම අනුව මී මැසි ජනපද මිලදී ගැනීම් සඳහා ඇණවුම් යවා තිබුණද, කොන්ත්‍රාත්කරු විසින් අදාළ ගිවිසුම් කාලයතුල රු.196,710 ක් වටිනා මී මැසි ජනපද (Colony) ලබා දී නොතිබුණි. ගිවිසුම පරිදි කටයුතු නොකළ කොන්ත්‍රාත්කරුගේ රු.165,625 ක් වටිනා කාර්යසාධන බැඳුම්කරය මුදල් කිරීමට කටයුතු කර නොතිබුණි.	ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසු බැඳුම්කර ආපසු ලබා දෙන ලදී. මෙම ව්‍යාපෘතිය සමූපකාර අංශය යටතේ වූ ව්‍යාපෘතියකි. මෙය නිසිලෙස ක්‍රියාත්මක කරන ලෙස උතුරු පළාත් ප්‍රධාන ලේකම් වෙත දිස්ත්‍රික් ලේකම් විසින් ලිපියක් යවා ඇත.	අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘතීන් දැඩි අධීක්ෂණයක් සහිතව සිදුකළ යුතු අතර, අදාල ව්‍යාපෘති ආරම්භ කර අපේක්ෂිත අරමුණ ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය.

4.4 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	තිරුනෙල්වේලි ප්‍රදේශයේ කිරි සැකසුම් කර්මාන්තශාලාවක් ඉදිකිරීම සහ එයට අවශ්‍ය උපකරණ මිළදී ගැනීම සඳහා පුද්ගලික කොන්ත්‍රාත්කරුවකු සමඟ රු56,640,750 ක මුදලකට 2018 වර්ෂයේ ගිවිසුම් ගතවී තිබුණි.ඒ අනුව ඉටුකළ වැඩ සඳහා දිස්ත්‍රික් ලේකම් විසින් එකතුව රු 4,911,486ක් ගෙවීම් කර තිබුණද, එයට අවශ්‍ය ප්‍රධාන යන්ත්‍රෝපකරණ සවිකර නොතිබීමෙන් මෙම ව්‍යාපෘතිය අත්හැර දමා තිබුණි. එසේ වුවද, ගිවිසුම අනුව කටයුතු නොකිරීම හේතුවෙන් රු.4,822,238ක් වටිනා කාර්යසාධන ඇපකරය මුදල් කර රජයේ ආදායමට බැර කිරීමට දිස්ත්‍රික් ලේකම් විසින් කටයුතු කර නොතිබුණි.	මෙම ව්‍යාපෘතිය සමූපකාර අංශය යටතේ වූ ව්‍යාපෘතියකි. මෙය නිසිලෙස ක්‍රියාත්මක කරන ලෙස උතුරු පළාත් ප්‍රධාන ලේකම් වෙත දිස්ත්‍රික් ලේකම් විසින් ලිපියක් යොමුකර ඇත.	- එම -

4.5 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	යුද්ධය හේතුවෙන් අවතැන්වී නැවත පදිංචි කර ඇති දුගී නිවාස ලාභීන්ගේ නිවස්වලට නොමිලේ විදුලි සම්බන්ධතා ලබා දීමේ ව්‍යාපෘති යටතේ 2024 වර්ෂයේ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලින් තෝරාගත් ප්‍රතිලාභීන් 321 දෙනෙකුට (නව	ප්‍රතිලාභීන් වෙත කඩිනමින් විදුලි සම්බන්ධතා ලබා දෙන බව විදුලි බල මණ්ඩලය විසින් දැනුම් දී ඇත.	විධිමත් අධීක්ෂණයක් හා පසු විපරමක් සිදු කර අදාළ ආයතනවලින් ජනතාවට ප්‍රතිලාභ ලබා දීමට කටයුතු නොකළ නිලධාරීන්ට පියවර

	සම්බන්ධතා සහ මාරු කිරීම්) වෙනුවෙන් එකතුව රු. 11,362,171 ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් විදුලි බල මණ්ඩලයට ගෙවීම් කර තිබුණි. එසේවුවද, මාස 08 ක් ඉකුත්වී ඇතත්, එම කාර්ය ඉටුවී නොතිබුණි.		ගැනීමත්, කඩිනම් මැදිහත්වීමක් සිදු කර අදාළ කාර්ය ඉටු කර ගැනීමටත් අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය.
(ආ)	නැවත පදිංචි කිරීම, නිවාස පහසුකම් හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය විසින් 2016 වර්ෂය සිට 2024 වර්ෂය දක්වා රු. මිලියන 01 ක් සහ රු. මිලියන 0.6 ක නිවාස යෝජනා ක්‍රමවලින් ප්‍රතිලාභීන් 498 දෙනෙකුගෙන් ප්‍රතිලාභීන් 60 දෙනෙකුගේ ඉදිකිරීම් කටයුතු සම්පූර්ණයෙන් නිමවී නොතිබුණද, සම්පූර්ණ මුදල වන රු.88,056,000 ක් ඔවුන්ගේ බැංකු ගිණුම්වල තැන්පත් කර තිබුණි.	නිදහස් නොකර ප්‍රතිලාභීන්ගේ වැඩ කඩිනමින් නිමකරන ලෙස දැනුවත් කර ඇත. නිමකිරීමෙන් පසු සම්පූර්ණ මුදල නිදහස් කිරීමට කටයුතු කරනු ලැබේ.	සම්පූර්ණයෙන් ඉදිකර නොතිබුණු නිවාස සඳහා මුදල් නිදහස් කිරීමට කටයුතු කළ නිලධාරීන්ට එරෙහිව කටයුතු කිරීමටත්, අමාත්‍යාංශයේ මාර්ගෝපදේශ අනුව, ඉදිකිරීම් ප්‍රගතිය අනුව, ප්‍රතිලාභීන්ට මුදල් නිදහස් කිරීමටත්, නිවාස ව්‍යාපෘතිය කඩිනමින් සම්පූර්ණ කිරීමටත් පියවර ගත යුතුය.
(ඇ)	තෙන්මරාච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රතිලාභීන් 08 දෙනෙකුට මී මැසි ජනපද 27 ක් ලබා දී තිබුණු බව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කෘෂිකර්ම නිලධාරි විසින් ලියකිවිලි සකස්කර ප්‍රතිලාභීන්ගෙන් අත්සන් ලබා ගෙන තිබුණද, ක්ෂේත්‍ර පරික්ෂණයේදී එම ප්‍රතිලාභීන් 08 දෙනෙකුට මී මැසි ජනපද 27 ක් වෙනුවට මුදලින් රු.67,230 ක් ලබා දී ඇති බව ප්‍රතිලාභීන් විසින් සනාථ කරනු ලැබේ.	අදාළ කාල පරිච්ඡේදයේ ලබා ගත හැකි මී මැසි ජනපද ලබා ගෙන නිකුත් කළ බව.	විධිමත් පරීක්ෂණයක් පවත්වා අක්‍රමවත්ව කටයුතු කළ නිලධාරීන්ට පියවර ගැනීමටත්, කොන්ත්‍රාත්කරු සමග ගිවිසගත් ගිවිසුම් අනුව කටයුතු කිරීමත් කළ යුතුය.

4.6 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් රු.75,323,600 ක් වියදම් කර 2019 වර්ෂයේදී ක්‍රියාත්මක කළ සුන්නාකම් මල අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතියට අදාළ වැඩ කොටස් සඳහා කොන්ත්‍රාත් කරු වෙත රු.65,955,381 ක් ගෙවා තිබුණද, අදාළ ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිමකර නොතිබුණි.	සුන්නාකම් මල අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රිය කරන ව්‍යාපෘතියේ ඉතිරි වැඩ සඳහා පහත සඳහන් තීරණයන් ගන්නා ලදි.පළාත් පාලන දෙපාර්තමේන්තුව සහ ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය අතර, අවබෝධතා ගිවිසුමක් (MOU) අත්සන් කළ යුතුය. තවද, පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් මෙම ව්‍යාපෘතිය සඳහා	අදාළ වගකිව යුතු ආයතන කඩිනමින් සම්බන්ධීකරණය කර ව්‍යාපෘතිය නිම කිරීමට කටයු කළ යුතුය.

		මිල ගණන් කැඳවීමේ කෙටුම්පත් මිල කැඳවීම් (Draft bidding Document) ලියවිලි ලැබී ඇත.ඒ අනුව ඉදිරි කටයුතු සිදු කෙරේ.	
(ආ)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වටිනාකම රු.1,656,250 ක් වැය කර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 06ක ක්‍රියාත්මක කරන ලද මී මැසි පාලන ව්‍යාපෘතිය යටතේ මී මැසි පාලන උපකරණ සහ මී මැසි ජනපද (**colony**) ලබා ගත් ප්‍රතිලාභීන් 51 දෙනෙකුගෙන්, ප්‍රතිලාභීන් 48 දෙනෙකුගේ නිවස්වල මී මැසි පාලන උපකරණ පමණක් තිබුණු බව ක්ෂේත්‍ර පරීක්ෂණයේදී නිරීක්ෂණය විය. එම මී මැසි පෙට්ටි වල ජනපද (**colony**) නොාතිබීමෙන් අදාල ව්‍යාපෘති මගින් අපේක්ෂිත අරමුණු ඉටුවී නොමැති බව නිරීක්ෂණ විය.	ස්වභාවික පරිසර හානින් හේතුවෙන් මී මැසි රංචු වෙන ස්ථානවලට යෑම නිසා ප්‍රතිලාභීන්ට එය අල්ලා ගැනීමට නොහැකිවී ඇත. අප නිලධාරීන් විසින් මී මැසි රංචු රඳවා ගන්නා ලෙස උපදෙස් ලබා දී ඇත.	ව්‍යාපෘතිය මඟින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට කටයුතු මෙහෙයවීම සිදු නොකළ නිලධාරීන්ට පියවර ගැනීමටත්, විධිමත් වැඩපිළිවෙලක් යොදා ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීමටත් පියවර ගත යුතුය.

4.7 ප්‍රසම්පාදන

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශය 5.3.1(ඇ) ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතුවලදී කෙටුම්පත් මිල කැඳවීම් ලියවිලි සඳහා තාක්ෂණ ඇගයීම් කමිටුවේ සහ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබා ගත යුතු වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අවස්ථා 35 කදී එම අනුමැතිය ලබා නොගෙන රු.221,342,507 ක් වටිනා ව්‍යාපෘති සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදුකර නොතිබුණි.	ප්‍රසම්පාදන මාර්ගොපදේශය 5.3.1(ඇ) අනුව ජාතික ප්‍රසම්පාදන නියෝජිත අයතනය විසින් අනුමත කරන ලද ආදර්ශ සම්මත මිල කැඳවුම් ලියවිලි සුළු වෙනස්කම් සිදුකර යොදවා ගන්නා ලදී.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට බැහැරව කටයුතු කළ නිලධාරීන්ට පයවර ගැනීමටත්, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කිරීමත් කළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 6.3.6 ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය රු.32,029,278 ක් වටිනා ප්‍රසම්පාදන ක්‍රියාවලි 07 කදී, මිල ගණන් විවෘත කිරීම් වාර්තාව (Format for Bid opening minutes) පිළියෙල කර නොතිබුණු අතර, එම ප්‍රසම්පාදනයන්ට අදාළ සැපැයුම්කරුවන් 07 දෙනෙකු ලබා දෙන වට්ටම් (Discount Offered) පිළිබඳ විස්තර සඳහන් කර නොතිබීමෙන්, මිල	මිල කැඳවීම් විවෘත කිරීම් වාර්තාව පිළියෙල කර තිබුණි. මිල ගණන් ඇගයීමේදී, වට්ටම් වෙනම සඳහන් නොකර වට්ටම් අඩුකර වටිනාකම සඳහන් කර තිබුණි. දැනට අදාල ආදර්ශය අනුව සටහන් උපලේඛන අමුණා, එහි වට්ටම් පිළිබඳ විස්තර සඳහන් කර ඇත.	විධිමත් පරීක්ෂණයක් පවත්වා අක්‍රමිකතාවයක් සිදු වී ඇත්නම් අදාළ පාර්ශව වෙත පියවර ගැනීමටත්, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කිරීමත් කළ යුතුය.

	කැඳවීම් ඇගයීමේදී (Bid Evaluation) වට්ටම් ඇගයීමට නොහැකි අතර, ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ඇගයීම්, තොරා ගැනීම් විනිවිදභාවය සම්බන්ධයෙන් තහවුරු කිරීමට නොහැකි විය.		
(ඇ)	වලිකාමම් උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ග්‍රාම සේවා වසම් 05 ක ඉඩම් හිමියන් 157 දෙනෙකුට ඉඩම් නිදහස් කිරීමට ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකර ළඳු කැළෑ, නටඹුන් සහ පඳුරු ඉවත් කිරීම සඳහා රු.5,029,838 ක් වැය කර තිබුණි.	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඇස්තමේන්තු අනුව අයිතිකරුවන්ගේ ඉඩම් ප්‍රමාණය අනුව ගෙවීම් කර ඇත.	ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකිරීම පිළිබඳව අදාළ පාර්ශව වෙත පියවර ගත යුතුය.
(ඈ)	රජය සතුව පැවති ඉඩම් හිමිකරුවන්ට නිදහස් කිරීම සඳහා ළඳු කැළෑ, නටඹුන් සහ පඳුරු ඉවත් කිරීම - 2024 වැඩ සටහන යටතේ සැපයුම්කරුවන් තෝරාගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සිදු කර සැපයුම්කරුවන් තුන් දෙනෙකුට වැඩ පවරා දීමේ ලිපි යවා තිබුණද, වලිකාමම් උතුර ප්‍රාදේශීය ලේකම් විසින් එම වැඩ කොටස් ඒකාබද්ධ කර එක් සැපැයුම්කරුවෙකු සමග පමණක් ගිවිසුම් අත්සන් කර රු.10,478,000 ක් ගෙවීම්කර තිබුණි. මෙය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන කමිටු තීරණයට පටහැනි බව නිරීක්ෂණය විය.	පඳුරු ඉවත් කිරීම සඳහා අවශ්‍ය Excavator 70,120, Dozer යන යන්ත්‍ර තෝරාගත් සැපැයුම් කරුවන් තිදෙනාගෙන් S.K Construction සතුව පමණක් තිබුණු බැවින්, අදාල වැඩ කොටස කඩිනමින් නිම කර වගා කටයුතු කඩිනම් කිරීම සඳහා ඔහු වෙත පවරන ලදී.	ප්‍රසම්පාදන ක්‍රියාවලියට පටහැනිව කටයුතු කිරීම සම්බන්ධයෙන් අදාළ පාර්ශව වෙත විධිමත් පියවර ගත යුතුය.

4.8 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක වත්කම් 34 ක් අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ විධිමත් පරිදි අපහරණය කර පොත්වලින් කපා හැරීමට කටයුතු කර නොතිබුණි.	වත්කම් කිහිපයක් අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට කටුයුතු කර ඇත. අනෙකුත් වත්කම් සම්බන්ධයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේ පොදු 47 ආකෘතියට ඇතුළත් කර භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ වාර්තාව අනුව ඉදිරි කටයුතු කරනු ලැබේ.	අළුත්වැඩියා කළ හැකි වත්කම් අළුත්වැඩියා කර උපයෝජනය කිරීමටත්, භාවිතා කළ නොහැකි වත්කම් විධිමත් පරිදි අපහරණය කිරීමත් කළ යුතුය.
(ආ)	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක් විසින් ප්‍රයෝජනයට ගනු ලබන ඉඩම්වල අයිතිය පවරා ගැනීමට වර්ෂ 04 සිට 12 දක්වා කාලයක් කටයුතු කර නොතිබුණි.	ඉඩම් පවරා ගැනීම් කටයුතු සිදු කරමින් පවති.	කඩිනම් වැඩපිළිවෙලක් යොදා භාවිතා කරනු ලබන ඉඩම්වල අයිතිය තහවුරු කරගත යුතුය.

4.9 රජයේ නිලධාරින්ගේ ඇප තැබීම්

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
මුදල් රෙගුලාසි 880 සහ ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ අංක 04/2022 හා 2022 මාර්තු 16 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව ඇප මුදල් ගෙවිය යුතු නිලධාරීන් රාජකාරි භාරගෙන මාස 03 ක් ඇතුළත ඇප මුදල් තැන්පත් කළ යුතු බව සඳහන් වූවද, වලිකාමම් දකුණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් 06 දෙනෙකු ඇප මුදල් තැන්පත් කර නොතිබුණු බව නිරීක්ෂණය විය.	නිලධාරීන් කිහිප දෙනෙකු ඇප තැන්පත් කර ඇති අතර, අනෙකුත් නිලධාරීන්ගෙන් ඇප මුදල් ලබා ගැනීමට කටයුතු කර ඇත.	චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි අනුව ඇප මුදල් ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

4.10 අනාර්ථික ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දිස්ත්‍රික්කයේ සියලු ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා අවශ්‍ය ඡායා පිටපත් කඩදාසි මිලදී ගැනීම වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් විසින් මිල ගණන් කැඳවා සුදුසුකම් ලත් ලංසුකරුවකු තෝරා ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත දන්වා තිබුණද දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මිල ගණන්වලට වඩා එකතුව රු.368,252 ක් වැඩිපුර ගෙවා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 කින් ඡායා පිටපත් යන්ත්‍ර මිලදී ගෙන තිබුණි.	ව්‍යාපෘතිවල වැඩ රාජකාරි බහුලවූ බැවින් ඡායා පිටපත් කොළ වැඩිපුර මිලදී ගැනීම් සිදුවිය. මිලදී ගැනීම් ප්‍රමාණය අඩුවීම නිසා මිල වල සුළු වෙනසක් සිදුවිය.	විධිමත් පරීක්ෂාවක් සිදු කර වැඩිපුර ගෙවූ මුදල් වගකිවයුතු පාර්ශව වෙතින් අය කිරීමටත්, නිසි පරිදි සැලසුම් කර අරපිරිමැස්මෙන් කාර්යක්ෂමව වියදම් කිරීමටත් කටයුතු කළ යුතුය.
(ආ)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ටෝනර් සඳහා මිල ගණන් කැඳවා මිල ගණන් තීරණය කර එම මිල ගණන් අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වලට දැනුම් දී තිබුණද, එම මිල ගණන්වලට වඩා එකතුව රු.167,255 ක් වැඩිපුර ගෙවා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක් විසින් ටෝනර් 84 ක් මිලදී ගෙන තිබුණි.	ව්‍යාපෘතිවල වැඩ රාජකාරි බහුලවූ බැවින් ටෝනර් වැඩිපුර මිලදී ගැනීම් සිදුවිය. මිලදී ගැනීම් ප්‍රමාණය අඩුවීම නිසා මිල වල සුළු වෙනසක් සිදුවිය.	- එම -

4.11 කළමනාකරණ අකාර්යක්ෂමතාවය

	විගණන නිරික්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වඩමරච්චි උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ස්ථාන මාරුවීම් ලද නිලධාරීන් 02 දෙනෙකුගේ පෞද්ගලික ලිපිගොනු ගෙන්වා ගැනීමට ඉකුත් මාස 16 සිට මාස 42 දක්වා ලබා ගැනීමට කටයුතු කර නොතිබුණ	පෞද්ගලික ලිපිගොනු ලබා ගැනීම සඳහා අදාල දෙපාර්තමේන්තු වෙත ලිපි යවා ඇත.	පෞද්ගලික ලිපිගොනු ගෙන්වා ගැනීමට කාලීනව පියවර නොගත් නිලධාරීන්ට විධිමත් පියවර ගැනීමටත්, කඩිනමින් පෞද්ගලික ලිපිගොනු ගෙන්වාගෙන ගොනු යාවත්කාලීන කිරීමත් කළ යුතුය.

5. මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරික්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ශ්‍රේණි හතරක අනුමත කාර්ය මණ්ඩලය 2061 ක් වුවද, තත්‍ය කාර්ය මණ්ඩලය 2720 ක් වූ අතර, සමාලෝචිත වර්ෂ අවසානයට පුරප්පාඩු සංඛ්‍යාව 207 ක් ද අතිරික්ත කාර්ය මණ්ඩලය 866 ක්ද විය.	පුරප්පාඩු පිළිබඳ අමාත්‍යාංශ වෙත දැනුම් දී ඇත. මෙතෙක් පිරවීමට කටයුතු කර නොතිබුණි. අතිරික්තව තිබුණු සංවර්ධන නිලධාරීන් ඇතුලු තොරතුරු තාක්ෂණ නිලධාරි අමාත්‍යාංශයෙන් පත්කර ඇත. ග්‍රාම නිලධාරීන් තනතුරු 04 ක් දැනට පුරවා ඇත. ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු සම්බන්ධයෙන් අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත.	කාර්ය මණ්ඩල සමාලොචනයක් සිදුකර අවශ්‍යම පුරප්පාඩු පමණක් පිරවීමටත්, අතිරික්ත සේවක සංඛ්‍යාව අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර පුරප්පාඩු පවතින ස්ථානවලට අනුයුක්ත කිරීමටත් කටයුතු කළ යුතුයි.